# වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේදී ශ්‍රමය ඉටු කළ කාර්යය[105]

සියලු ධනයේ මූලාශ්‍රය ශ්‍රමය බව දේශපාලන ආර්ථිකවේදියෝ කියා සිටිති. ශ්‍රමය විසින් ධනය බවට පරිවර්තනය කෙරෙන ද්‍රව්‍ය සපයන ස්වභාව ධර්මයට පමණක් දෙවෙනි වන එය, ඇත්තෙන්ම ධනයෙහි මූලාශ්‍රයයි. එහෙත් ශ්‍රමය අපරිමිත ලෙස ඊටත් වඩා වැඩි මනත් දෙයකි. සකලවිධ මානව පැවැත්මේ ප්‍රථම මූලික කොන්දේසිය ශ්‍රමයයි. එය කෙතෙක් දුරකට එසේ දැයි කිවහොත්, එක්තරා අරුතකින්, ශ්‍රමය විසින් මිනිසා නිර්මාණය කළේ යැයි අප විසින් කිව යුතුය.

වසර සිය දහස් ගණනාවකට ඉහත, තවමත් නියත වශයෙන් නිර්ණය කළ නොහැකි යුගයෙක, පෘථිවියේ ඉතිහාසයෙහි භූවිද්‍යාඥයින් විසින් තෘතීයික යුගය නමින් හඳුන්වනු ලබන අවධියෙහි, බොහෝ විට එහි අවසාන භාගයේදී පමණ, නිවර්තන කලාපයේ කිසියම් ප්‍රදේශයක - ඇතැම් විට අද ඉන්දියානු සාගරයේ පතුළට ගිලී ඇති මහාද්වීපයක - විශේෂයෙන්ම බෙහෙවින් දියුණු මානව කල්ප වානරයින් වර්ගයක් විසූහ. අපේ මේ පූර්වජයින් ගැන ඩාවින් අපට ආසන්නතම විස්තරයක් දී ඇත. ඔවුන්ගේ ගත මුළුමනින්ම ලොම්වලින් වැසී ගත් අතර, ඔවුන්ට දිගටි හැඩයෙන් යුතු කන් සහ යටි රැවුල්ද තිබුණි. ඔවුහු රංචු වශයෙන් රුක්මත විසූහ.[106]

ගස් නැගීමේදී අත්වලට හා පාවලට විවිධ කාර්යයන් පැවරේ. ඔවුන්ගේ ජීවන රටාව හේතු කොට ගෙන සමතලා බිම්වල සංචරණය කිරීමට සිදුවූ විට මෙම වානරයෝ ඇවිදීමේදී සිය අත් භාවිතා කිරීමේ පුරුද්දෙන් ක්‍රමයෙන් ඈත්වූ අතර වඩ වඩාත් ඍජු ඉරියව්වක් යොදා ගත්හ. **වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේ තීරණාත්මක පියවර** මෙය විය.

අද ජීවත්වන සියලුම මානව කල්ප වානරයින්ට ඍජුව සිට ගෙන ඔබ මොබ යාමට හැකි වුවද, එසේ කරනුයේ හදිසි වුවමනාවකදී සහ ඉතා නුහුරු ආකාරයකට පමණකි. ඔවුන්ගේ ස්වාභාවික ගමන අර්ධ ඍජු ඉරියව්වකින් සිදු කෙරෙන අතර, ඒ සඳහා අත්ද භාවිතා කෙරේ. වැඩි හරියක් මිටෙහි ඇඟිලි පුරුක් බිම රඳවා දෙපා හකුළුවා ඉහළට ඔසවා, අබ්බගාතයෙකු කිහිළි කරු ආධාරයෙන් ගමන් කරන්නා සේ, ඔවුන්ගේ දිගු අත් අතරින් සිරුර ඉදිරියට පද්දවති. පොදුවේ ගත් කල අද වානරයින් අතර, හතර ගාතයෙන් ඇවිදීමේ සිට දෙපයින් ඇවිදීම දක්වා සියලුම සංක්‍රාන්තික අවධි දක්නට ලැබේ. කෙසේ වුවද, දෙපයින් ගමන ඒ කිසිවකු සඳහා වත් තාවකාලික දෙයකට වඩා වැඩිමනක් දෙයක් වී නැත.

ලොම්වලින් ගහන වූ අපගේ පූර්වජයින්ගේ ඍජු ගමන ප්‍රථමයෙන්ම රීතියක් බවටත්, අනතුරුව කාලයාගේ ඇවෑමෙන් අවශ්‍යතාවයක් බවටත් පත්වී නම්, මේ අතර තුර අත්වලට සෙසු විවිධාකාර කාර්යයන් පැවරී ඇති බව සිතීම හේතු සහගතය. දැනටමත් වානරයින් අතර අත් සහ පා පාවිච්චි කරනු ලබන ආකාරයෙහි යම් වෙනසක් ඇත්තේය. ඉහත සඳහන් කළ පරිදි, ගස් නැගීමේදී අත් හා පාවලින් ලබන ප්‍රයෝජනය වෙනස්ය. වානරයින් විසින් අත් පාවිච්චි කරනුයේ පහත් ශ්‍රේණියේ ක්ෂීරපායී සතුන් සිය ඉදිරිපස පාද පාවිච්චි කරන්නාක් මෙන් ප්‍රධාන කොට කෑම එකතු කිරීමට හා අල්ලා ගැනීමටය. බොහෝ වානරයෝ තමන් සඳහා කූඩු සෑදීමට නැතිනම් නිදසුනක් වශයෙන් චිම්පන්සියන් කරන්නා සේ කාලගුණයෙන් ආරක්ෂා වීම සඳහා ගස්වල අතු අතර පියසි සෑදීමට සිය අත් පාවිච්චි කරති. සතුරන්ගෙන් ආරක්ෂා වීමට ඔවුන් දඬු ගන්නේද සිය අත්වලිනි. එසේම ඔවුහු පළතුරු ගෙඩි හා ගල්වලින් සතුරන්ට දමා ගසන්නේද අත්වලිනි. බන්ධනයට අසු වූ විට ඔවුහු මිනිසාගෙන් කොපි කරන ලද සරල ක්‍රියාවන් ගණනාවක් සඳහා තම අත් පාවිච්චි කරති. මිනිසාට ඉතා සමාන වූ වානරයින්ගේ නොදියුණු අත සහ වසර සිය දහස් ගණනක ශ්‍රමයෙන් බෙහෙවින් පරිපූර්ණ වූ මිනිස් අත අතර විශාල පරතරය අයෙකු දකින්නේ මෙහිදීය. මිනිස් සහ වානර අත්වල ඇට සහ පේශි සංඛ්‍යාව සහ සැකසුම එක සමාන වුවද, කිසිදු මානව කල්ප වානරයෙකුගේ අතින් කළ නොහැකි ක්‍රියාවන් සිය ගණනාවක් පහත්ම මිලේච්ඡයාගේ අතට ඉටු කළ හැකිය. ඉතාම රළු ගල් පිහිය වුව කිසිදිනෙක වානර අතින් හැඩගැන්වී නැත.

වානරයාගේ සිට මිනිසා දක්වා සංක්‍රාන්ත වීමේ වසර දහස් ගණනාවක කාලය තුළ අපේ පූර්වජයින් ක්‍රමයෙන් සිය අත් අනුහුරුකර ගැනීම ඉගෙන ගත්තා වූ ප්‍රථම ක්‍රියාවන් ඉතා සරල ඒවා පමණක් විය. පහත්ම මිලේච්ඡයින්, සමගාමී ශාරීරික පරිහානියක් සමග සත්වයින් වැනි තත්ත්වයකට ප්‍රතිගමනයක් සිදුවී ඇතැයි උපකල්පනය කළ හැකිවුන් පවා, කෙසේ වුවද මෙම සංක්‍රාන්තික සත්ත්වයින් වූ වානරයින්ට වඩා බෙහෙවින් උසස්ය. මිනිස් අත්වලින්

---

105 - සොබා දහමේ දයලෙක්තිකය සඳහා කරුණු අන්තර්ගත දෙවන ගොනුවේ පටුනෙහි මෙම ලිපියට එංගල්ස් දී තිබූ සිරස්තලය මෙයයි, මෙම ලිපිය මුලින්ම එංගල්ස් විසින් ලියන ලද්දේ වහල් ක්‍රමයේ මූලික ස්වරූප තුන (Die drei Grundformen der Knechtschaft) නමැති වඩා පුළුල් කෘතියක හැඳින්වීම වශයෙනි. පසුව එංගල්ස් මෙම සිරස්තලය කම්කරුවා වහල්භාවයට පත්කිරීම. හැඳින්වීම (Die Knechtung des Arbeiters. Einleitung) යනුවෙන් වෙනස් කළේය, කෙසේ වුවද, මෙම කාර්යය අවසන් නොකර ඉතිරි වූ නිසා, අවසානයේ එංගල්ස් එහි හැඳින්වීමේ කොටසට, වානරයාගේ සිට මිනිසා දක්වා සංක්‍රාන්තියේදී ශ්‍රමය ඉටු කළ කාර්යය නමැති සිරස්තලය යෙදීය. මෙය කෘතියේ අත්පිටපතට අනුකූලවේ. මෙම ලිපිය පැහැදිලි ලෙසම 1876 ජූනි මස ලියන ලද්දකි.

106 - චාල්ස් ඩාවින්ගේ The Descent of Man, and Selection in Relation to Sex. (1 වෙළුම, ලන්ඩන් 1871) කෘතියේ On The Affinities and Genealogy of Man (මිනිසාගේ බන්ධුතාවයන් සහ පරම්පරාව ගැන) නමැති VI වෙනි පරිච්ඡේදය බලන්න.

ප්‍රථම ගල්පතුර පිහියක් බවට හැඩගැන්වීමට පෙර, ඇතැම් විට ගෙවී ගිය කාලය හා සසඳන විට අප දන්නා ඉතිහාසමය කාල පරිච්ඡේදය ඉතා අල්ප එකක් සේ දිස්වේ. එහෙත් තීරණාත්මක පියවර ගෙන තිබුණි, **අත නිදහස් වී තිබුණි**, ඉන් අනතුරුව එයට වඩාත් විශාල හුරුකමක් අත්කර ගැනීමට හැකි විය. මේ ආකාරයෙන් අත්කර ගත් වඩාත් විශාල නම්‍යතාවය පරම්පරාවෙන් පරම්පරාවට උරුමවීම සහ වැඩිවීම සිදුවිය.

එනයින් අත ශ්‍රමයේ ඉන්ද්‍රිය පමණක් නොවේ, **එය ශ්‍රමයේ ඵලයද වේ**. ශ්‍රමය මගින් පමණක්, නව ශ්‍රම කාර්යවලට වඩ වඩාත් අනුහුරුවීම මගින්, එහි ප්‍රතිඵලය වූ පේශිවල, බන්ධනිවල සහ ඊටත් වඩා වැඩි කාලයක් මුළුල්ලේ හස්තයේ අස්ථිවලද විශේෂ වර්ධනයේ උරුමය මගින් සහ මෙසේ ආවේනික වූ සියුම් බව නවතමවූද වඩ වඩාත් සංකීර්ණවූද කාර්යයන් සඳහා සදාකල්හි අලුතින් උපයෝගී කර ගැනීම මගින් මිනිස් අත රපායෙල්ගේ සිත්තම්, තොර්වාල්ඩ්සෙන්ගේ පිළිරූ පගනීනිගේ සංගීතය නිර්මාණය කිරීමට හැකි තරම් උසස් මට්ටමේ පරිපූර්ණත්වයක් අත්කර ගැනීමට සමත්විය.

එහෙත් අත හුදෙකලාව පැවතුනේ නැත. එය අඛණ්ඩ වූද ඉතාමත් සංකීර්ණවූද ඉන්ද්‍රියක කොටසක් පමණක් විය. අත ලැබුවා වූ ප්‍රයෝජනය එය සේවය කළා වූ මුළුමහත් සිරුරම ලැබීය. මෙය දෙයාකාරයකින් සිදුවිය.

ප්‍රථම කොටම, ඩාවින් පැවසූ පරිදි සිරුර වර්ධනයේ සහසම්බන්ධය පිළිබඳ නියමයෙන් වාසි ලාබීය. එම නියමය අනුව ඓන්ද්‍රිය සත්ත්වයෙකුගේ වෙන් වෙන් කොටස්වල විශේෂිත ස්වරූප, ඒවාට දෘශ්‍යමාන ලෙස සම්බන්ධයක් නැති අනෙක් කොටස්වල ඇතැම් ස්වරූප සමග නිරන්තරයෙන්ම බැඳී ඇත. එනයින් සෛල න්‍යෂ්ටිකය රහිත රක්ත රුධිර සෛල ඇති, හිස ප්‍රථම කශේරුකාවට සන්ධාන (කන්දක) දෙකක් මගින් සම්බන්ධ වී ඇති සත්ත්වයින්ටද ව්‍යතිරේකයක් රහිතවම තම පැටවුනට කිරිදීම සඳහා සස්තන ග්‍රන්ථි ඇත. එමෙන්ම දෙබලට බෙදුණු කුර ඇති ක්ෂීරපායී සතුන්ට බහු රෝමන්ථක උදරයක් ඇත. ඇතැම් ස්වරූපවල වෙනස් වීමත් සමග සිරුරේ වෙනත් කොටස්වල වෙනස්වීම්ද දක්නට ලැබේ. කෙසේවුවද අපට මෙහි සම්බන්ධය විස්තර කළ නොහැකිය. නිල් පැහැ ඇස් ඇති, පූර්ණ සුදු පැහැති බළල්ලු නිතරම, නැතිනම් නිතර පාහේ බිහිරන් වෙති. මිනිස් අතෙහි ක්‍රමයෙන් වැඩි වන අංගසම්පූර්ණත්වයද, ඊට සරිලන ලෙස පාද ඍජු ගමන සඳහා අනුවර්තනය වීමද, නිසැකයෙන්ම එවැනි සහසම්බන්ධයක් හේතුකොට ගෙන සිරුරෙහි අනෙක් කොටස් මත ප්‍රතික්‍රියාවක් දැක්වීය. කෙසේ වුවද මෙම කරුණු සාමාන්‍ය වශයෙන් ගෙන හැර දැක්වීමට වඩා යමක් කීමට තරම් මෙම ක්‍රියාකාරීත්වය ප්‍රමාණවත් ලෙස විමර්ශනය කරනු ලැබ නැත.

ශරීරයේ අනෙකුත් අවයවයන් මත අතෙහි වර්ධනය ඇති කරනු ලබන ඍජු හා ප්‍රදර්ශනය කළ හැකි බලපෑම වඩාත් වැදගත්ය. අපේ වානර පූර්වජයා රැළවැසි සතෙකු බව දැනටමත් සඳහන් කරනු ලැබ ඇත. සියලුම සතුන්ගෙන් ඉතාමත්ම සමාජමය සත්ත්වයා වන මිනිසා රැළවැසි නොවූ ආසන්නතම පූර්වජයින්ගෙන් ව්‍යුත්පන්න වීම සෙවීම පැහැදිලි ලෙසම අපහසුය. අතෙහි වර්ධනයත් සමග, ශ්‍රමයත් සමග සොබා දහම මෙල්ල කිරීම ආරම්භ වූ අතර සෑම නව ඉදිරි ගමනකදීම මිනිසාගේ බුද්ධි සීමාව (දිගන්තය) පුළුල් කළේය. ඔහු නොකඩවාම, ස්වාභාවික වස්තුවල මේ තාක් අප්‍රකට ගුණයන් සොයා ගන්නට විය. අනෙක් අතින් ශ්‍රමයේ වර්ධනය සමාජයේ සාමාජිකයින් අතර අන්‍යොන්‍ය ආධාරය සහ එක්සත් ක්‍රියාකාරීත්වය වැඩි කරමින්, සහ එක් එක් පුද්ගලයාට මෙම එක්සත් ක්‍රියාකාරීත්වයේ වාසිය පැහැදිලි කරමින් ඔවුන් වඩ වඩාත් සමීප කිරීමට අවශ්‍යයෙන්ම ආධාර විය. කෙටියෙන් කියතොත්, මිනිසා බවට පරිවර්තනය වෙමින් සිටි මොවුහු එකිනෙකාට **යමක් පැවසිය යුතු** අවධියකට අවතීර්ණ වූහ. අවශ්‍යතාවය ඉන්ද්‍රිය බිහි කළේය. වානරයාගේ නොදියුණු ස්වරාලය සෙමින් වුවද, ස්ථිර ලෙස ශබ්ද නිසි ලෙස හැසිර වීම මගින් නිත්‍ය වශයෙන්ම වඩාත් වර්ධනය වූ ශබ්ද හැසිරවීමක් දක්වා පරිණාමනය වූ අතර මුඛයෙහි වූ ඉන්ද්‍රියයෝ ක්‍රමයෙන් පැහැදිලි ශබ්ද එකිනෙක උච්චාරණය කිරීමට උගත්තෝය.

භාෂාවේ මූලාරම්භය ඇති වුයේ ශ්‍රම ක්‍රියාදාමයෙනැයි එම විස්තර කිරීම එකම නිවැරදි දෙය බව, සතුන් සමග සැසඳීමේදී ඔප්පු වෙයි. සතුන් අතුරෙන් ඉතාමත් වර්ධනය වූ සතුන් අල්පයට පවා එකිනෙකාට යම් යම් දේ දන්වා සිටීමේදී පැහැදිලි කතාව අවශ්‍ය නොවේ. ස්වාභාවික තත්ත්වයන්හිදී කිසිදු සතෙකුට මිනිස් බස කතා කිරීමට හෝ තේරුම් ගැනීමට හෝ ඇති නොහැකියාව නිසා පාඩුවක් සිදුවන බවක් නොහැඟෙයි. මිනිසා විසින් සතුන් හීලෑ කිරීමෙන් පසු තත්ත්වය හාත්පසින්ම වෙනස්ය. මිනිසාගේ ඇසුරෙන් බල්ලාගේ සහ අශ්වයාගේ කණ පැහැදිලිව හඬ නගා කරන කතාවට කෙතරම් හොඳින් පුරුදුව ඇත්දැයි කිවහොත්, ඔවුහු තමන්ගේ සංකල්ප පරිමාව ඇතුළත ඕනෑම බසක් වටහා ගැනීමට පහසුවෙන් උගනිති. තවද, ඔවුහු මුලදී ඔවුන්ට නුපුරුදු දේ වන, මිනිසා කෙරෙහි ආදරය, කෘතඥතාවය ආදී හැඟීම් ඇතිකර ගැනීමේ හැකියාවක් අත්කර ගනිති. මෙවැනි සතුන් සමග බොහෝ සම්බන්ධකම් ඇති කරගත් මිනිසෙකු බොහෝ අවස්ථාවලදී, මොවුන්ට කතා කිරීමට නොහැකි වීම අඩුපාඩුවක් වශයෙන් ඔවුන්ටම **දැන්** දැනෙන බව අනිවාර්යයෙන්ම අවබෝධ කරනු ඇත. එසේ වුවද අවාසනාවකට මෙන් ඔවුන්ගේ ස්වර ඉන්ද්‍රියයන් එක්තරා නිශ්චිත දිසාවකට බෙහෙවින් විශේෂිතකරණය වී ඇති හෙයින් ඊට තවදුරටත් පිළියම් යෙදිය නොහැකිය. කෙසේ වුවද, ස්වර ඉන්ද්‍රියයන් පවත්නා තන්හි ඇතැම් සීමාවන් තුළ වුවද මෙම නොහැකියාව අතුරුදහන්වී යයි. පක්ෂීන්ගේ මුඛ ඉන්ද්‍රියයන්ට වඩා හාත්පසින්ම වෙනස් වුවද, කථා කිරීම උගෙනීමෙහි සමත් එකම සතා පක්ෂියා පමණකි. තවද පක්ෂීන් අතුරෙන් වඩාත්ම අප්‍රසන්න කටහඬක් ඇති ගිරවා අන් සියලුම පක්ෂීන්ට වඩා හොඳින් කතා කරයි. ගිරවාට තමා කතා කරන දෙය නොවැටහේය යන කියමනට කිසිවෙක් විරුද්ධ නොවෙත්වා. හුදෙක් මිනිසා සමග කතා කිරීමට සහ ඇසුරු කිරීමට ඇති ආශාව නිසාම, උගේ මුළු ශබ්දකෝෂයම නිරන්තරව පුනරුච්චාරණය කරමින් ගිරවා එක දිගට පැය ගණනක් කතා කරනු ඇත. එහෙත් උගේ සංකල්ප පරිමාව ඇතුළත

උෟට තමා කියන දෙයද වටහා ගැනීමට උගත හැකිය. ගිරවාට තේරුම වටහා ගත හැකි පරිදි පරුෂ වචනයක් උගැන් වුවහොත් (නිවර්තන කලාපික රටවල සිට ආපසු එන නාවිකයින්ගේ ඉතාමත් ජනප්‍රිය විනෝදයකි) උෟට සරදම් කළ විටක උෟ එම වචන බර්ලිනයේ වට්ටි අම්මා කෙනෙකු මෙන් නිවැරදිව පරුෂ වචනයෙන් බැණ වැදීමට පාවිච්චි කරන බව ඔබට වහාම දැක ගත හැකි වනු ඇත. රස කෑම ඉල්ලා සිටීමේදීද උෟ එලෙසම හැසිරෙනු ඇත.

ප්‍රථමයෙන්ම ශ්‍රමයද, ඉන් අනතුරුව සහ එයත් සමගම කථාවද - යන මේ දෙකෙහි උත්තේජනය යටතේ වානරයාගේ මොළය ක්‍රමයෙන් මිනිස් මොළය දක්වා පරිවර්තනය වූ අතර, මිනිස් මොළය වානරයාගේ මොළයට වඩා විශාල වී අංග සම්පූර්ණ බවට පත්විය. මොළය වර්ධනය වීමත් සමගම එහි ඉතාමත් සමීපතම උපකරණ වන සංවේදන ඉන්ද්‍රියයන් වර්ධනය විය. කතාවේ ක්‍රමානුකූල වර්ධනයත් සමගම ඊට අනුරූපව ශ්‍රවණ ඉන්ද්‍රියයන් සියුම් වීම සිදුවූවාක් මෙන්, සමස්තයක් වශයෙන් මොළය වර්ධනය වීමත් සමගම සියලුම ඉන්ද්‍රියයන්ද සියුම් වීමක් සිදුවේ. මිනිසාට වඩා බොහෝ දුර රාජාලියාට පෙනෙයි, එහෙත් රාජාලි ඇසට වඩා මිනිස් ඇස බොහෝ දේ වෙන් කොට හඳුනා ගනී. මිනිසාට වඩා බෙහෙවින් තියුණු ගඳ සුවඳ දැනීමේ හැකියාවක් බල්ලාට ඇති නමුදු, මිනිසාට විවිධ දේ පෙන්නුම් කරන නිශ්චිත සළකුණු වන්නා වූ සුවඳවලින් සියයකින් පංගුවක්වත් බල්ලාට වෙන් කොට අඳුනා ගත නොහැකිය. වානරයාට උගේ රළුතම මුල් ස්වරූපයේදී කොහෙත්ම නැත්තා වූ ස්පර්ශ සංවේදීතාව වර්ධනය වී ඇත්තේ ශ්‍රමයේ මාධ්‍යයෙන් මිනිස් අතෙහිම වර්ධනයත් සමගය.

මොළයේ සහ ඊට අනුබද්ධ සංවේදනයන්ගේ වර්ධනයද, විඥානයේ වර්ධිත පැහැදිලිතාවයද, වියුක්තිකරණයේ සහ විනිශ්චයේ බලයද ශ්‍රමය සහ කතාව මත ඇති කළ ප්‍රතික්‍රියාව ශ්‍රමය සහ කතාව යන දෙකටම වඩ වඩාත් වර්ධනය වීමට නව ආවේගයක් ලබා දුනි. අවසානයේදී මිනිසා වානරයාගෙන් පැහැදිලි ලෙස වෙන් වූ විට මෙම වර්ධනය එහි අවසානයට පැමිණියේ නැත. එහෙත් සමස්තයක් වශයෙන් එය තවදුරටත් ප්‍රබල වර්ධනයකට භාජනය වූ අතර, එම වර්ධනයේ ප්‍රමාණය සහ දිශාව විවිධ මිනිසුන් අතර විවිධ වකවානුවලදී වෙනස් වූයේ, එක් හෝ තවත් තැනෙක ප්‍රාදේශීය හෝ තාවකාලික ප්‍රතිගමනයන් මගින් ඊට බාධාවන් පවා ඇති විය. මෙම වැඩිදුර වර්ධනය, එක් අතකින් ප්‍රබල ලෙස ඉදිරියට ගෙනයනු ලැබ ඇත්තේද, අනෙක් අතින් වඩාත් නිශ්චිත දිසාවක් ඔස්සේ මෙහෙය වනු ලැබ ඇත්තේද, අංග සම්පූර්ණ වූ මිනිසාගේ බිහි වීමත් සමගම ක්‍රියාත්මක වූ නව අංගයක් වන **සමාජය** විසිනි.

ගස් නගින වඳුරු රංචුවකගෙන් මානව සමාජය බිහිවීමට පෙර, සත්තකින්ම වසර ලක්ෂ ගණනක් - පෘථිවියේ ඉතිහාසය අනුව බලන විට මෙම කාලය මිනිසෙකුගේ ජීවිත කාලයෙන් එක් තත්පරයකට වඩා වැදගත් කමින් වැඩි නොවෙයි* - ගෙවී ගොස් ඇත්තේය. එහෙත් අවසානයේදී එය බිහි විය. වඳුරන් රංචුවක් සහ මානව සමාජය අතර ප්‍රධාන වෙනස වශයෙන් යළිත් වරක් අප දකින්නේ කුමක්ද? **ශ්‍රමයයි**. වානර රංචුව භූගෝලීය කොන්දේසි මගින් හෝ අසල්වැසි රංචුවල ප්‍රතිරෝධය මගින් හෝ නිර්ණය කරනු ලැබුණ ප්‍රදේශයේ ආහාර කා දැමීමෙන් සෑහීමකට පත්විය. නව අහර බිම් දිනා ගැනීමට එය සංක්‍රමණ සහ අරගලවල යෙදුනි. එහෙත් ඔවුන් නොදැනුවත්වම සිය අසූචිවලින් පස පොහොර කිරීම හැරුණු විට, ස්වාභාවික තත්ත්වය යටතේ තමන්ට පිරිනැමුනා වූ දෙයට වඩා වැඩිමනත් දෙයත් පොළවෙන් ලබා ගැනීමට ඔවුහු අසමත් වූහ. සියලුම අහර බිම් වානරයින් විසින් අල්ලා ගත් පසුව වානර ජනගහනය තවදුරටත් වැඩි වීමට නොහැකි විය. වැඩිම වුවහොත් සතුන් සංඛ්‍යාව නොවෙනස්ව පැවතිය යුතු විය. එහෙත් සියලුම සත්තු ආහාර විශාල ප්‍රමාණයක් අපතේ හරින අතර, ඊට අමතරව ආහාර සැපයුමේ ඊළඟ පරම්පරාව බීජ අවස්ථාවේදීම විනාශ කර දමති. දඩයක්කාරයා මෙන් නොව වෘකයා, මුවදෙන වුව ඉතිරි නොකරයි. මේරීමට පෙර ළපටි පඳුරු කා දමන ග්‍රීසියේ එළුවෝ රටෙහි සියලු කඳුවල පැළෑටි කාදමා ඒවා මුඩු බිම් බවට පත්කර ඇත්තාහුය. සතුන්ගේ මෙම ''කොල්ලකාරී ආර්ථිකය'' සතත්ත්ව විශේෂයන්ට සුපුරුදු අහර හැරුණු විට වෙනත් අහරවලට අනුහුරු වීමට බල කිරීම මගින්, විශේෂයන්ගේ ක්‍රමික පරිණාමනයේදී වැදගත් මෙහෙයක් ඉටු කරයි. මෙම හේතුව නිසා ඔවුන්ගේ රුධිරය වෙනස් රසායනික සංයුතියක් අත් කර ගන්නා අතර, මුළුමහත් කායික නිර්මාණය ක්‍රමයෙන් වෙනස් වේ. මේ අතර ඊට අනුවර්තනය නොවූ සත්ත්ව විශේෂ වඳවී යයි. මෙම කොල්ලකාරී ආර්ථිකය අපේ පූර්වජයින් වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමට බලවත් සේ දායක වූ බවට කිසිදු සැකයක් නැත. බුද්ධියෙන් සහ අනුවර්තන හැකියාවෙන් අනෙක් සියල්ල මහත් සේ අභිබවා ගියා වූ වානර වර්ගයක් සම්බන්ධයෙන් බලන කල මෙම කොල්ලකාරී ආර්ථිකය, අහර සඳහා පාවිච්චි කරනු ලැබූ පැළෑටි සංඛ්‍යාව නිරන්තරවම වැඩි කිරීමටත්, ආහාර පැළෑටිවල කෑමට සුදුසු කොටස් වැඩි වැඩියෙන් පරිභෝජනයටත් හේතු වූවා විය හැකිය. කෙටියෙන් කියතොත් ආහාර සමග සිරුරට ඇතුලු වූ පදාර්ථයන් මෙන්ම, එනම් මිනිසා දක්වා පරිවර්තනය වීමේ රසායනික පදනම වූ පදාර්ථ මෙන්ම, ආහාරද වඩ වඩාත් විවිධාකාර විය. එහෙත් ඒ සියල්ල තවමත් වචනයේ නියම අරුතින් ශ්‍රමය නොවීය. ශ්‍රමය ආරම්භ වනුයේ උපකරණ සෑදීමත් සමගය. දැනට සොයා ගෙන ඇති, ප්‍රාග් ඓතිහාසීය මිනිසාගෙන් අපට උරුම වී ඇත්තා වූ ආදිතම උපකරණ අනුවද, මුල්ම ඓතිහාසීය ජනතාවන්ගේ සහ නොදියුණුම සමකාලීන ම්ලේච්ඡයන්ගේ ජීවන රටාව අනුවද, අපට සොයා ගත හැකි ඉතාමත් පුරාණ උපකරණ මොනවාද? ඒවා දඩයම් කිරීමේ හා මාළු ඇල්ලීමේ උපකරණය. දඩයම් කිරීමේ උපකරණ අවි වශයෙන්ද පාවිච්චි කෙරිණි. එහෙත් සතුන් දඩයම් කිරීම සහ මාළු ඇල්ලීම තනිකරම එළවලු ආහාරයේ සිට එළවලු සමග සමගාමීව මස් අනුභවය දක්වා පරිවර්තනය පූර්වාකල්පනය කරන අතර, මෙය වානරයාගේ සිට මිනිසා දක්වා පරිවර්තනය වීමේ ක්‍රියාදාමයේ තවත් වැදගත් පියවරක් වේ. ශරීරයේ

* මේ ක්ෂේත්‍රයේ ප්‍රධාන විශේෂඥයෙකු වන, සර් විලියම් තොම්සන් ගණන් බලා ඇති පරිදි, පැළෑටි සහ සතුන්ට පෘථිවිය මත ජීවත්වීමට තරම් ප්‍රමාණවත් ලෙස සිසිල් වීමට **වසර කෝටි දහයකට වඩා වැඩි කාලයක්** ගත වී ඇත. - **{එංගල්ස්ගේ සටහනකි}**

පරිවෘත්තීය සඳහා අත්‍යවශ්‍ය බොහෝ පදාර්ථයන් සාදා පිළියෙළ කළ ආකාරයෙන් **මස් ආහාරයෙහි** අඩංගු විය. ආහාර දිරවීමට වුවමනා කාල සීමාව කෙටි කිරීම මගින්, එය පැළෑටි ජීවිත ක්‍රියාවලියට සමානුරූපීවූ වෙනත් වර්ධක දේහ ක්‍රියාවලිද කෙටි කරමින්, ඒ අනුව නියම සත්ත්ව ජීවිතයේ සක්‍රීය ප්‍රකාශිත වීම සඳහා කාලය, ද්‍රව්‍ය සහ ආශාව ලබා ගති. වැඩී එන මිනිසා වඩ වඩාත් පැළෑටි ලෝකයෙන් ඈත්වත්ම, ඔහු සතෙකුට වඩා ඉහළ තත්ත්වයකට නැංගේය. මාංශ සමග ශාඛ ආහාරයකට පුරුදුවීම කැළෑ බළලුන් සහ බල්ලන් මිනිසාගේ මෙහෙකරුවන් බවට පරිවර්තනය කළා සේම ශාඛ ආහාරයක් සමග මාංශ ආහාරයකට අනුහුරු වීම වැඩී එන මිනිසාට ශාරීරික ශක්තිය සහ ස්වාධීනත්වය ලබා දීමට මහත් සේ දායක විය. කෙසේ වුවද, මාංශ ආහාරය මොළයෙහි වර්ධනය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ අතර, දැන් එහි පෝෂණයට හා වර්ධනයට අවශ්‍ය වඩාත් සාරවත් ජීව පදාර්ථ මාලාවක් ලබා ගති. එම නිසා මොළයට පරම්පරාවෙන් පරම්පරාවට වඩාත් වේගයෙන් සහ වඩා අංග සම්පූර්ණ ලෙස වර්ධනය වීමට හැකි විය. මාංශ ආහාරයක් රහිතව මිනිසා මිනිසෙකු බවට පත් නොවූ බව, එළවළු ආහාර පමණක් අනුභව කරන්නන්ට නිසි ගෞරව සහිතව කිව යුතුව ඇත. එසේම මාංශ භක්ෂණය අප දන්නා සියලු ජනතාවන් අතර කුමන කාලයක හෝ මිනී මස් කෑමකට හේතු වී නම් (බර්ලින්වරුන්ගේ මුතුන්මිත්තන් වූ වෙලෙටාබි නැතිනම් විලිසියානුන් දහවන සියවස දක්වාම සිය දෙමාපියන්ගේ සිරුරු ආහාරයට ගත්හ),[107] අද අපට ඉන් ඇති පලක් නැත.

මාංශ ආහාරය තීරණාත්මක වැදගත්කමකින් යුතු නව වර්ධනයන් දෙකකට මගපෑදීය. එනම් ගින්දර උපයෝගී කර ගැනීම සහ සතුන් හීලෑ කිරීමය. ගින්දර පාවිච්චිය ආහාර දිරවීමේ ක්‍රියාවලිය තවදුරටත් කෙටි කළේය. එමගින් අර්ධ ලෙස දිරවූ වැනි ආහාර මුඛයට ලබා දුන් බැවිනි. සතුන් ඇති කිරීම, දඩයම් කිරීමට අමතරව මස් සැපයීමේ නව සහ වඩාත් ක්‍රමානුකූල මාර්ගයක් විවෘත කරමින් මස් සැපයීම සුලබ කළ අතර, සංයුතියෙන් අඩු ගණනේ මස් තරම්ම වටිනා නව ආහාරයක් වන කිරි සහ කිරි ආහාර වර්ග සැපයීය. එනයින් මේ ජයග්‍රහණ දෙකම මිනිසාගේ විමුක්තිය සඳහා වූ නව මාධ්‍යයක් විය. මිනිසාගේ සහ සමාජයේ සංවර්ධනය සඳහා වූ මේවායේ අනියම් බලපෑමෙහි වැදගත්කම කෙතරම් විශාල වුවද, ඒ ගැන මෙහිදී විස්තර කිරීම අප අදාල ක්ෂේත්‍රයෙන් ඉතාමත් ඔබ්බට යාමක් වනු ඇත.

මිනිසාගෙ කෑමට සුදුසු සෑම දෙයක්ම පරිභෝජනය කිරීමට ඉගෙන ගත් පරිදිම, හේ ඕනෑම දේශගුණයක ජීවත් වීමටද ඉගෙන ගත්තේය. ලෝකයේ ජීවත්විය හැකි සෑම පෙදෙසකම වාසය කිරීමට පටන් ගත් මිනිසා ස්වශක්තියෙන් එසේ කළ හැකි එකම සත්ත්වයාද විය. සියලු දේශගුණයන් යටතේ ජීවත් වීමට පුරුදු වූ අනෙක් සත්තු - හීලෑ සත්තු සහ පණුවෝ - එම තත්ත්වයන් පත් වුයේ ස්වාධීන ලෙස නොව මිනිසාගේ නැගීමත් සමග පමණකි. මිනිසා තමාගේ මුල් ජන්ම භූමියේ ඒකාකාර ලෙස උෂ්ණ දේශ ගුණයේ සිට ගිම්හානය සහ ශීත කාලය වශයෙන් වසර බෙදුණා වූ ශීත ප්‍රදේශවලට පැමිණීමත් සමග අලුත් අවශ්‍යතාවයන් මතු විය. ශීත සහ තෙතමනයෙන් ආරක්ෂා වීම සඳහා නිවාස අවශ්‍ය විය. එනයින් මිනිසා තව තවත් සතුන්ගෙන් වෙන් කළා වූ නව ශ්‍රම ක්ෂේත්‍රද, නව කාර්ය ක්ෂේත්‍රද බිහි විය.

අත්වල, කතා කිරීමේ ඉන්ද්‍රියවල සහ මොළයේ ඒකාබද්ධ ක්‍රියාකාරීත්වය මගින් එක් එක් පුද්ගලයා තුළ පමණක් නොව සමාජය තුළද මිනිස්සු වඩ වඩාත් සංකීර්ණ ක්‍රියාකාරීත්වයන් සපුරාලීමට සමත් වූ අතර, වඩ වඩාත් උසස් අරමුණු ඇති කර ගැනීමටද ඒවා දිනා ගැනීමටද සමත්වූහ. එක් එක් පරම්පරාවේ කාර්යයන්ද, විවිධ, වඩාත් අංග සම්පූර්ණ සහ වඩාත් නානාවිධ ඒවා බවට පත්විය. දඩයම් කිරීම සහ සත්ත්ව පාලනයට ගොවිතැනද එකතු විය. අනතුරුව, නූල් කැටීම, රෙදිවිවීම, ලෝහ වැඩ, වලන් සෑදීම සහ මුහුදු තරණයද ඇති විය. වෙළඳාම සහ කර්මාන්තයත් සමග කලාව සහ විද්‍යාවද අවසානයේදී බිහි විය. ගෝත්‍ර ජාතීන් සහ රාජ්‍ය බවට වර්ධනය විය. නීතිය සහ දේශපාලනය පැන නැගිණි. ඒවාත් සමග මිනිස් මනසේ, මනුෂ්‍ය දේවල්වල එම මනස්සෘෂ්ටික ප්‍රතිබිම්බය වූ ආගම ඇති විය. ප්‍රථමයෙන්ම මනසෙහි ඇති වන නිෂ්පාදිතයන් වශයෙන් පෙනී ගිය සහ මිනිස් සමාජයන් පාලනය කරන දේ ලෙස පෙනී ගිය මේ සියලු ප්‍රතිරූප ඉදිරියේ වැඩ කරන හස්තයේ වඩාත් සරල නිෂ්පාදනයන් පසුතලයට ඇද වැටුණි. මෙය වඩාත් මෙසේ වූයේ, ශ්‍රමය සැලසුම්ගත කළ මනස, සමාජ සංවර්ධනයේ ඉතාමත්ම මුල් අවධියකදී (නිදසුනක් වශයෙන්, එවකටත් ආදිකාලීන පවුලේ) සිය හස්තය මගින් නොව පිටස්තර හස්තයක් මගින්, එකී සැලසුම් කරන ලද ශ්‍රම කාර්යය ඉටුකරවා ගැනීමට සමත් වීම නිසාය. ශිෂ්ටාචාරයේ සීඝ්‍ර ඉදිරිගමන සඳහා මුළු සම්මානයම පිරිනැමුණේ මනසටය, මොළයේ වර්ධනයට සහ ක්‍රියාකාරීත්වයටය. මිනිස්සු තම ක්‍රියාවන් තම අවශ්‍යතාවන්ගෙන් පැන නගිනු වෙනුවට තම සිතිවිලිවලින් පැන නගින බවක් කීමට පුරුදු වූහ. (කෙසේ වුවද මේවා මනස තුළ පරාවර්තනය වීම සහ අවබෝධ වීම සිදුවේ); මේ අනුව කාලයාගේ ඇවෑමෙන්, විශේෂයෙන්ම පෞරාණික ලෝකයේ බිඳ වැටීමෙන් පසුව මිනිසුන්ගේ මනසෙහි ආධිපත්‍ය දැරූ එම විඥානවාදී ලෝක දෘෂ්ටිය පැනනැංගේය. මෙම විඥානවාදී ලෝක දෘෂ්ටිය තවමත් කෙතෙක් දුරට ඔවුන් පාලනය කරන්නේදැයි කිවහොත්, ඩාවින්වාදී ගුරුකුලයේ උපරිම වශයෙන් භෞතිකවාදී ස්වභාව විද්‍යාඥයෝ පවා තවමත් මිනිසාගේ සම්භවය පිළිබඳව පැහැදිලි අදහසක් ඇති කර ගැනීමට අපොහොසත්ව සිටිති. මක්නිසාදයත් මෙම විඥානවාදී දෘෂ්ටිමය බලපෑම යටතේ ඔවුහු එහිදී ශ්‍රමය විසින් ඉටු කරන ලද කාර්යය නොපිළිගන්නා හෙයිනි.

---

107 - එංගල්ස් මෙහිදී සඳහන් කරනුයේ ජර්මන් ජාතික පූජකයකු වූ ලේබියෝ නොට්කර්ගේ (952-1022) සාක්ෂිය ගැනය. එය ජේ. ග්‍රිම්ගේ, Deutsche Rechtsalterthwmer (ජර්මන් නීතියේ පුරාණ චාරිත්‍ර) ගොටින්ජන්, 1828, කෘතියෙහි 488 පිටුවෙහි සඳහන් කර ඇත. එංගල්ස් නොට්කර්ගේ එම සාක්ෂිය තම අවසාන නොකළ කෘතියක් වන, *අයර්ලන්ත ඉතිහාසය* පොතෙහි උපුටා දක්වයි.

NMSG Library

අප විසින් දැනටමත් සඳහන් කර ඇති පරිදි, සත්තුද, මිනිසා තරම්ම දුරකට නොවූවද, උන්ගේ ක්‍රියාකාරීත්වය අනුව පරිසරය වෙනස් කරති. එසේම අප දැනටමත් දැක ඇති පරිදි, මේ වෙනස්වීම් ඒවා ඇති කළ අය මත පෙරළා බලපෑමක් ඇති කරමින් ඔවුන්ද වෙනසකට භාජනය කරයි. ස්වභාව ධර්මයෙහි කිසිවක් හුදකලාව සිදු නොවේ. සෑම දෙයක්ම අනෙක් සෑම දෙය කෙරෙහිම බලපාන අතර, අනෙක් සෑම දෙය මගින් බලපෑම් ඇති කරනු ලබයි. අපේ ස්වභාව විද්‍යාඥයින් සරලතම දේ ගැන පවා පැහැදිලි ප්‍රතිභානයක් ලබා ගැනීමෙන් වළක්වනු ලබනුයේ බොහෝ සෙයින් මෙම බහුවිධ චලිතය සහ අන්තර් ක්‍රියාව අමතක කර දමන නිසාය. ග්‍රීසියේ වනාන්තර පුනර්වර්ධනය එළුවන් විසින් වළකා ඇති අයුරු අපි දැක ඇත්තෙමු; ශාන්ත හෙලේනා දූපතට පැමිණි මුල් වැසියන් විසින් ගෙනෙන ලද එළුවන් සහ ඌරන් එහි මුල් ස්වාභාවික වෘක්ෂ ලතා ආදිය කා දමා සම්පූර්ණයෙන්ම මෙන් විනාශ වූ හෙයින් පසුකලෙක නාවිකයින් හා ජනපද වාසීන් ගෙනෙන ලද අලුත් පැලෑටි වර්ග රෝපණය කිරීමට පසුබිම සැකසිනි. එහෙත් සතුන් සිය පරිසරය මත කල්පවත්නා බලපෑමක් ඇති කරනුයේ අචේතනිකවය, එසේම සතුන්ගේ පැත්තෙන් ගත් කල එය සිදුවනුයේ අහම්බෙනි. කෙසේ  වුවද, මිනිසුන් සතුන්ගෙන් වඩා ඈත්වන තරමට, ස්වභාව ධර්මය මත සතුන් ඇති කරන බලපෑම වඩ වඩාත්, කලින් සිතා ගත් නිශ්චිත අරමුණු දෙසට යොමු කරන ලද පූර්වකල්පිත, සැලසුම් කරනලද ක්‍රියාවක ස්වරූපයක් ගනු ඇත. තමන් කරන්නේ කුමක් දැයි යන්න පිළිබඳ අවබෝධයකින් තොරව සත්තු යම් ප්‍රදේශයක වෘක්ෂලතාදිය විනාශ කර දමති. මිනිසා ඒවා විනාශ කරන්නේ, එමගින් එළි කරන ලද භූමියේ ධාන්‍ය වැපිරීමට හෝ වගා කළ ප්‍රමාණය මෙන් කීප ගුණයකින් එලදාව ගත හැකි, ගස් හෝ මිදි රෝපණය කිරීමටය. ඔහු ප්‍රයෝජනවත් පැලෑටි සහ හීලෑ සතුන් එක් රටකින් තවත් රටකට ගෙන ගොස් එමගින් මුළු මහාද්වීපවලම ශාක හා සත්ත්ව සංහතිය වෙනස් කරයි. එපමණක්ද නොවේ. මිනිසා අතින් කෙරෙන කෘතිම අභිජනනය මගින් පැළෑටි හා සතුන් හඳුනා ගත නොහැකි තරම් වෙනස් වේ. අපේ ධාන්‍ය වර්ග බිහිවූයේ කුමන වල් පැලෑටිවලින්ද යන්න තවමත් සොයනු ලබන නමුත් එය නිෂ්ඵල ප්‍රයත්නයක් වී ඇත. අපේ බෙහෙවින් වෙනස් බලු වර්ග හෝ ඒහා සමානවම විවිධාකාර අශ්ව වර්ග පැවත එනු ලැබ ඇත්තේ කුමන වල් සතුන්ගෙන්ද යන්න පිළිබඳ තවමත් මත භේදයක් පවතී.

කෙසේ වුවද සැලසුම්සහගත හා පූර්ව කල්පිත ආකාරයකින් ක්‍රියා කිරීමට සතුන්ට ඇති හැකියාව පිළිබඳ මතභේදයක් ඇති කර ගැනීමට, ඇත්තෙන්ම අපේ අදහසක් නැත. ඊට ප්‍රතිපක්ෂව, ප්‍රාක් ප්ලාස්මය, ජීවමය ඇල්බියුමිනය පවත්නා සහ ප්‍රතික්‍රියා කරන, එනම්, නියත බාහිර උත්තේජනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, අතිශයින් සරල වුවද, නිශ්චිත චලනයන් සිදු කරන සෑම තන්හිම සැලසුම්ගත ක්‍රියා පිළිවෙළක් කලලයේ පවතියි. තවමත් ස්නායු සෛලයක් තබා, කිසිදු සෛලයක් නොමැති තැන්වල පවා එවැනි ප්‍රතික්‍රියා හටගනියි. කෘමීන්කාදමන පැළෑටි සිය ගොදුර අල්ලා ගැනීම සිදුකරන ආකාරයෙහි එක්තරා සැලසුම්ගත ක්‍රියා පිළිවෙළක් තිබුණද, ඒවා එසේ කරනුයේ බෙහෙවින් අවිඥාත ලෙසය. සවිඥාත, සැලසුම්ගත ක්‍රියාකාරීත්වය සඳහා සතුන්ගේ හැකියාව ස්නායු පද්ධතියේ වර්ධනයට සමානුපාතික වන අතර, ක්ෂීරපායි සතුන් අතර එය සෑහෙන තරම් උසස් මට්ටමක් අත්කර ගනී. එංගලන්තයේදී හිවල් දඩයමේ යෙදෙන විට, හිවලා තමා ලුහු බඳින්නන්ගෙන් බේරීම සඳහා ප්‍රදේශය පිළිබඳ උගේ විශිෂ්ට දැනුම නොවරදිනා සුලු ලෙස උපයෝගි කර ගන්නා අන්දමත්, ඉව ඇල්ලීමේදී වහනය වන සුවඳ නැති කිරීම සඳහා භූමියේ සියලුම වාසිදායක තත්ත්වයන් ඉතා හොඳින් ඉවහල් කර ගන්නා අන්දමත් අයෙකුට දිනපතාම බැලිය හැකිය. අපේ හීලෑ සතුන් අතර, මිනිසාගේ ඇසුර නිසා ඉතාමත්ම දියුණු තත්ත්වයට පත්වුවන් තුළ ළමයින්ගේ කපටිකම්වලට සමාන කපටි ක්‍රියාවන් අයෙකුට නිරීක්ෂණය කළ හැකිය. මක්නිසාදයත්, මවු කුස තුළ මිනිස් කලල රූපයේ සංවර්ධන ඉතිහාසය, වසර දසලක්ෂ  ගණනාවක් මුළුල්ලේ පනුවාගේ සිට අපේ සත්ත්ව පූර්වජයින්ගේ කායික පරිණාම ඉතිහාසයේ සංක්ෂිප්ත පුනරාවර්තනයක් පමණක් වන්නා සේම, මිනිස් ළදරුවාගේ මානසික වර්ධනයද අපේ එම සත්ත්ව පූර්වජයින්ගේම, යටත් පිරිසෙයින් මෑත කාලයේ සත්ත්වයින්ගේ මානසික වර්ධනයේ ඊටත් වඩා සංක්ෂිප්ත පුනරාවර්තනයක් වන හෙයිනි. එහෙත් සියලු සතුන්ගේ සියලු සැලසුම්ගත ක්‍රියාවන් ස්වභාව ධර්මය මත ඔවුන්ගේ අභිමතයේ මුද්‍රාව තැබීමට කිසිදිනෙක සමත් නොවීය. එය මිනිසාට පැවරිණි.

කෙටියෙන් කිවහොත්, සතා හුදෙක් ඌ අවට පරිසරය **පාවිච්චි කොට**, හුදෙක් උගේ පැවතීම මගින් එය තුළ පරාවර්තනයන් සිදු කරයි. මිනිසා තමා විසින් සිදුකරන වෙනස් කිරීම් මගින් එය තමාගේ අවශ්‍යතාවයන් සඳහා සේවයට යොදවා ගනී, එය මත සිය **ආධිපත්‍යය පතුරුවයි**. මිනිසා සහ සෙසු සතුන් අතර ඇති අවසාන මූලික වෙනස මෙය වන අතර, මෙම වෙනස ඇති කරනුයේද යළිත් ශ්‍රමයමය*. සොබා දහම අභිබවා මිනිසා ලබා ඇති ජයග්‍රහණ ගැන අපි එතරම් මුලාවට පත් නොවෙමු. ඒ එක් එක් ජයග්‍රහණ සඳහා සොබා දහම අපෙන් පළි ගනී. ඒ එක් එක් ජයග්‍රහණය, ප්‍රථම කොටම, අප බලාපොරොත්තු වූ ප්‍රතිඵල ගෙන එයි. එහෙත් දෙවනුව හා තෙවනුව, කලින් නුදුටුවා වූ හාත්පසින්ම වෙනස් ප්‍රතිවිපාක ලබා දෙන අතර, ඒවා නිතරම පාහේ මුල් ජයග්‍රහණය අහෝසි කරයි. මෙසපොතේමියාවේ, ග්‍රීසියේ හා සුළු ආසියාවේ වගාවන් සඳහා බිම් ලබා ගැනීමට කැලෑ විනාශ කර දැමූ මිනිස්සු, කැලෑත් සමගම තෙතමනය එක්කාසුවන මධ්‍යස්ථාන සහ ජලාශද විනාශ කර දමමින් තමන් එම රටවල වත්මන් මුඩු බිම් ඇති කිරීමට පදනම දැමූ බව නොදත්හ.[108] ඉතාලි ජාතිකයෝ ඇල්ප්ස් කඳුවල උතුරු බෑවුමේ පයින් වනාන්තර

* අත් පිටපතෙහි කෙළවර තීරුවේ පැන්සලයකින්, ''**Ennoblement**'' (උත්කෘෂ්ඨවීම) යන වචනය ලියා ඇත. - **සංස්කාරක**

108 - පැලෑටි ජීවිතය සහ දේශගුණය කෙරෙහි මිනිස් ක්‍රියාකාරීත්වයේ බලපෑම සම්බන්ධයෙන් එංගල්ස්, ප්‍රාස්ගේ Klima und Pflanzenwelt in der Zeit (කාලයාගේ ඇවෑමෙන් දේශගුණය සහ පැලෑටි ජීවිතය), ලෑන්ඩ්ෂට්, 1847, කෘතිය උපයෝගී කර ගනියි. 1868 මාර්තු 25 දිනැති ලිපියකින් මාක්ස් මෙම පොත කෙරෙහි අවධානය යොමු කරන ලෙස එංගල්ස්ට දැන්වීය.

ඉතාමත් ප්‍රවේසමෙන් රැක ගනිමින්, දකුණු බෑවුමේ පයින් වනාන්තර කපා දැමූ විට, එසේ කිරීමේදී ඔවුන් තම ප්‍රදේශයේ කිරි පට්ටි පාලනය සමූලඝාතනය කරමින් සිටියෝ යයි ඔවුන් තුළ කිසිදු හැඟීමක් නොවීය. එසේ කිරීමේදී අවුරුද්දේ වැඩි කාලයක්ම, කඳුකර උල්පත් ජලය තමනට අහිමි කර ගන්නා බවද, මේ නිසා වැසි කාලවලදී අති විශාල ජල කඳක් තැනිතලා භූමියට ඇද වැටෙන බවද පිළිබඳව ඔවුන්ට එතරම්වත්  දැනීමක් නොතිබුණි. පිටි සහිත නාලවලින් යුතු අර්තාපල් යුරෝපයේ පතුරුවා හැරි මිනිස්සු ඒ සමගම කණ්ඨමාල රෝගයද පතුරුවා හැරි බව දැන නොසිටියහ. මේ අනුව, අප කිසිසේත්, දිග්විජය කළ තැනැත්තෙක් විදේශීය ජනතාවක් පාලනය කරන ආකාරයෙන් ස්වභාව ධර්මය පාලනය නොකරන බවත්, ස්වභාව ධර්මයෙන් පරිබාහිරව සිටින්නා වූ තැනැත්තෙකු ලෙස නොසිටින බවත්, අපද අපේ මස්, ලේ සහ මොළය සහිතව ස්වභාව ධර්මයට අයත්ව ඇති අතර, එය තුළම ජීවත් වන බවත්, ස්වභාව ධර්මය කෙරෙහි අපේ ආධිපත්‍යය පැතිර වීම සංයුක්ත වනුයේ, ස්වභාව ධර්මයේ නියමයන් හඳුනා ගෙන ඒවා නිවැරදි ලෙස අදාල කර ගැනීමට සමත් විමෙන් අපට අනෙක් සියලුම සතුන්ට වඩා වාසිදායක තත්ත්වයක් තිබේය යන කරුණින් බවත් අපට සෑම පියවරක දීම මතක් කරනු ලැබේ.

ඇත්ත වශයෙන්ම, ගෙවී යන සෑම දවසක් පාසාම අප මෙම නියම ගැන වඩා හොඳ වැටහීමක් ලබා ගන්නා අතර, ස්වභාව ධර්මයේ සම්ප්‍රදායික ගමන් මගට අපේ ඇඟිලි ගැසිමෙන් ඇති වන වඩාත් ක්ෂණික සහ වඩාත් දුරස්ථ ප්‍රතිවිපාක ගැන සංජානනය කිරීමට ඉගෙන ගනිමු. විශේෂයෙන්ම, වත්මන් සියවසේ ස්වභාව විද්‍යාව විසින් අත්පත්කර ගන්නා ලද දැවැන්ත ජයග්‍රහණයන්ගෙන් පසුව, වෙන කවරදාකටත් වඩා අපි, අපේ එදිනෙදා නිෂ්පාදන කටයුතු සාර්ථක කරගැනීමටත්, එසේම එනයින් අඩු ගණනේ ඒවායේ වඩාත් දුරස්ථ ප්‍රතිවිපාක පවා පාලනය කිරීමටත් හැකි තත්ත්වයක සිටිමු. එහෙත් මෙම තත්ත්වය වඩ වඩාත් වර්ධනය වත්ම, මිනිසුන්ට ස්වභාව ධර්මය සමග ඔවුන්ගේ ඒකත්වය වැඩි වැඩියෙන් හැඟනවා පමණක් නොව ඔවුන්ට එය අවබෝධ වනු ඇත, එසේම යුරෝපයේ ආචීර්ණ කල්පික පෞරාණිකත්වයේ බිඳ වැටීමෙන් පසුව පැන නැගි ක්‍රිස්තියානි ආගම තුළ එහි ඉහළම විස්තාරණය ලබාගත්තා වූ, සිත සහ ද්‍රව්‍ය අතරත්, මිනිසා සහ ස්වභාව ධර්මය අතරත්, ආත්මය සහ ශරීරය අතරත් ඇතැයි කියන ප්‍රතිවිරෝධයක් පිළිබඳ තේරුමක් නැති, අස්වාභාවික සංකල්පය වඩ වඩාත් අපහසු දෙයක් බවට පත් වනු ඇත.

නිෂ්පාදන ක්ෂේත්‍රයේ අපේ ක්‍රියාකාරීත්වයේ වඩාත් දුරස්ථ **ස්වාභාවික** විපාක ගණන් බලන්නේ  කෙසේද යන්න පිළිබඳ මඳක් ඉගෙන ගැනීමට අපට වසර දහස් ගණනක ශ්‍රමය අවශ්‍ය විය, එහෙත් මෙම ක්‍රියාවන්ගේ වඩාත් දුරස්ථ **සමාජීය** විපාක ගැන සොයා බැලීම ඊටත් වඩා දුෂ්කර කාර්යයක් වී ඇත. අර්තාපල් වැවීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් පැතිර ගිය කණ්ඨමාල රෝගය ගැන අපි සඳහන් කළෙමු. එහෙත් කම්කරුවන් අර්තාපල් ආහාරයකට පුරුදුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළුමහත් රටවල්වල බහුජනතාවගේ ජීවන තත්ත්වය මත එය ඇති කළ බලපෑම සමග සංසන්දනය කරන විට හෝ 1847 අර්තාපල් රෝගයේ ප්‍රතිවිපාකයක් වශයෙන් අයර්ලන්තය පුරා වසා පැතුරුණු සාගතය සහ එම සාගතය සම්පූර්ණයෙන්ම නැතිනම් සම්පූර්ණයෙන්ම මෙන් අර්තාපල්වලින් පෝෂණය වූ අයර්ලන්ත වැසියන් දස ලක්ෂයක් මරුමුවට පත් කිරීම සහ තවත් විසි ලක්ෂයක් ජනතාවට රට අතහැර යාමට බල කිරීම සමග සසඳන කල කණ්ඨමාල රෝගය කුමක්ද? අරාබි ජාතිකයින් මද්‍යසාර පෙරීමට ඉගෙන ගත් විට, එසේ කිරීම මගින් ඔවුහු, එකල ඒවන විටත් සොයා ගෙන නොතිබූ ඇමෙරිකා මහද්වීපයේ මුල් පදිංචිකරුවන් සමූලඝාතනය කිරීම සඳහා ඉවහල් වන ප්‍රධාන අවියක් නිර්මාණය කිරීමෙහි යෙදෙන බවක් කිසිසේත් නොසිතූහ. අනතුරුව කොලම්බස් මෙම ඇමෙරිකාව සොයා ගත් විට, එසේ කිරීමෙන් ඔහු යුරෝපයේ බොහෝ කලකට පෙර බැහැර කර තිබූ වහල් ක්‍රමයට නව පණක් දෙන බවත්, නීග්‍රෝ වහල් වෙළඳාමට නව පදනමක් දමන බවත් නොදත්තේය. දහහත්වන සහ දහඅටවන සියවස්වල, වාෂ්ප ඇන්ජිම නිර්මාණය කිරීමට ශ්‍රමය වැය කළ මිසනිස්සු, තමන් අන් සියලුම උපකරණවලට වඩා, ලොව මුළුල්ලෙහිම සමාජ සබඳතා විප්ලවීයකරණයකට හසුකරන උපකරණය සාදමින් සිටින බව නොසිතූහ. විශේෂයෙන්ම යුරෝපයේ අල්පතරයක් අත ධනය සංකේන්ද්‍රණය කිරීමෙන් සහ අති විශාල බහුතරය නිර්ධනීන් බවට පත් කිරීමෙන් මෙම උපකරණය, ප්‍රථමයෙන්ම ධනේශ්වර පංතියට සමාජ හා දේශපාලන ආධිපත්‍යය ලබා දීමටත්, එහෙත් අනතුරුව ධනේශ්වර පංතිය පෙරළා දමා සියලු පංති ප්‍රතිඝතිතතාවයන් අහෝසි කිරීමෙන් පමණක් අවසන් වන, ධනේශ්වර පංතිය සහ නිර්ධන පංතිය අතර පංති අරගලය බිහි කිරීමටත් නියමිත විය. එහෙත් මෙම ක්ෂේත්‍රයේද, දීර්ඝ සහ බොහෝ විට කෲර අත්දැකීම් මගින්ද, ඉතිහාසමය සාධක එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම මගින්ද, අපේ නිෂ්පාදන ක්‍රියාකාරීත්වයේ අනියම් සහ, වඩා දුරස්ථ සමාජ ප්‍රතිවිපාක ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අපි උගනිමින් සිටින අතර, ඒ අනුව මෙම ප්‍රතිවිපාකයන්ද පාලනය කිරීමට සහ හැසිරවීමට ඉඩ ප්‍රස්තාවක් ලබා ගනිමු.

කෙසේ වුවද මෙම හැසිරවීම ක්‍රියාත්මක කිරීමට හුදු දැනුමට වඩා වැඩිමනත් දෙයක් අවශ්‍ය වේ. මේ සඳහා අපේ මේ දක්වා පැවත එන නිෂ්පාදන මාදිලියේ සහ ඒ සමගම අපේ සමකාලීන සමාජ පිළිවෙළේද සම්පූර්ණ විප්ලවයක් සිදු කිරීම අවශ්‍ය වේ.

මේ තාක් පැවති සියලු නිෂ්පාදන මාදිලි හුදෙක් ශ්‍රමයේ ඉතාමත් ක්ෂණික සහ කෙළින්ම ප්‍රයෝජනවත් ඵලය අත්කරගැනීම පමණක් ඉලක්ක කර ගති. පසු කලෙකදී මතුවන සහ ක්‍රමික පුනරාවර්තනය සහ සමුච්ඡය මගින් ක්‍රියාත්මක වන වැඩිදුර ප්‍රතිවිපාක සම්පූර්ණයෙන්ම නොසලකා හැරිණි. මුලින් පැවති සාමූහික ඉඩම් අයිතිය, එක් අතකින්, පොදුවේ ගත් කල තමන්ට ඉතාම සමීපව පැවති දෙයට මිනිසුන්ගේ දැනුම සීමා වූ සංවර්ධන මට්ටමකට අනුරූප වූ අතර, අනෙක් අතින්, මේ ආදි කල්පික ආර්ථික ක්‍රමයේ ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල හරිගස්සා ගැනීමට යම් ඉඩකඩක් ලැබෙන එක්තරා ඉඩම් අතිරික්තයක් පූර්ව නිගමන කළේය. මේ ඉඩම් අතිරික්තය අවසන් වූ

විට, පොදු අයිතියද බිඳ වැටුණි. කෙසේ වුවද, වඩාත් දියුණු සියලුම නිෂ්පාදන ස්වරූප ජනගහනය විවිධ පංතිවලට විභේදනය වීමටද එමගින් පාලක සහ පීඩිත පංති අතර ප්‍රතිඝතිතතාවයට තුඩු දුනි: මේ අනුව, නිෂ්පාදනය තවදුරටත් පීඩිත ජනතාවගේ දළ යැපීම් මාධ්‍ය පමණක් සැපයීමකට සීමා නොවූ හෙයින්, පාලක පංතියේ වුවමනාවන් නිෂ්පාදනයේ නියාමක සාධකය බවට පත්විය. අද බටහිර යුරෝපයේ පවත්නා ධනවාදී නිෂ්පාදන මාදිලියෙන් මෙය ඉතාමත් පූර්ණ ලෙස ක්‍රියාත්මක කරනු ලැබ ඇත. නිෂ්පාදනය සහ හුවමාරුව පාලනය කරන පෞද්ගලික ධනපතියෝ සමත්ව සිටිනුයේ, තමන්ගේ ක්‍රියාවල ඉතාමත්ම ක්ෂණික වූද, ප්‍රයෝජනවත් වූද ඵලය ගැන සලකා බැලීමට පමණකි. ඇත්ත වශයෙන්ම මෙම ප්‍රයෝජනවත් ඵලය වුවද - එය, නිපදවනු ලබන හෝ හුවමාරු කරනු ලබන භාණ්ඩයේ ප්‍රශ්නයක් වන පමණින්ම - පසු තලයට ඇද වැටෙන අතර, එකම දිරිගැන්වීම වනුයේ විකිණීමෙන් ලැබෙන ලාභය පමණකි.*

*        *        *

ධනේශ්වර පංතියේ සමාජ විද්‍යාව වන ආචීර්ණ කල්පික දේශපාලන ආර්ථික විද්‍යාව මූලික වශයෙන් නිරතව ඇත්තේ, නිෂ්පාදනයට සහ හුවමාරුවට සම්බන්ධ මිනිස් ක්‍රියාකාරිත්වයේ කෙළින්ම අදහස් කෙරෙන සමාජ විපාකයන් ගැන සාකච්ඡා කිරීමට පමණකි. එය න්‍යායික ප්‍රකාශනය වන්නා වූ සමාජ සංවිධානයට මෙය පූර්ණ ලෙස අනුරූපී වේ. පෞද්ගලික ධනපතියන් ක්ෂණික ලාභය තකා නිෂ්පාදනයේ සහ හුවමාරුවේ නිරත වී සිටින නිසා, සැලකිල්ලට යොමු කළ හැකි වනුයේ, ප්‍රථම කොටම ආසන්නතම සහ ඉතාමත් ක්ෂණික ලාභය පමණකි. පෞද්ගලික නිෂ්පාදකයෙක් හෝ වෙළෙන්දෙක් නිෂ්පාදනය කරන ලද හෝ මිළට ගන්නා ලද හුවමාරු භාණ්ඩයක් සුපුරුදු ගිජු ලාභයත් සමග විකුණන පමණින් සෑහීමකට පත්වන අතර, පසුව එම භාණ්ඩයට හෝ එය මිළදී ගත් පුද්ගලයින්ට කුමක් සිදුවේද යන්න නොතකයි. එම ක්‍රියාවලිම ස්වාභාවික විපාකයන්ටද එයම අදාල වේ. කියුබාවේ කඳු බෑවුම්වල වනාන්තර ගිනිබත් කොට, එම අළුවලින්, ඉතා ඉහළ ලාභයක් ලැබූ **එක්** පරපුරක කෝපි වගාවක් සඳහා පමණක් ප්‍රමාණවත් පෝර ලබා ගත් ස්පාඤ්ඤ වැවිලි කරුවන්ට ඇති රුදාවෙක් වීද! - අනතුරුව ඇදහැලුන දැඩි නිවර්තන වර්ෂා පතනයෙන්, හිස් පර්වතය පමණක් ඉතිරි කරමින්, අනාරක්ෂිත උඩ පස් තට්ටුව සෝදා ගෙන ගිය විට ඔවුන්ට ඇති රුදාවෙක් වීද! සමාජය සම්බන්ධයෙන් මෙන්ම ස්වභාව ධර්මය සම්බන්ධයෙන්ද ගත් කල, වත්මන් නිෂ්පාදන මාදිලිය මූලික වශයෙන්ම සැලකිල්ල යොමු කරන්නේ ක්ෂණික සහ ඉතාමත් පැහැදිලි ප්‍රතිඵලය කෙරෙහි පමණකි. ඉන් අනතුරුව මෙම අරමුණ දෙසට යොමු කළ ක්‍රියාවල වඩාත් දුරස්ථ ප්‍රතිවිපාක බෙහෙවින් වෙනස් ඒවා බවට පත් වීම ගැන, ඒවා බොහෝ සෙයින්, හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ ස්වභාවයක් දැරීම ගැන විමතිය පළ කරනු ලැබේ; එසේම සෑම දස වසරකට වරක්ම කාර්මික චක්‍රයේ ගමන් මගින් පෙන්වා ඇති පරිදි, ඉල්ලුම සහ සැපයුම අතර සංගතිය ඒවායේ ධ්‍රැවීය විරෝධයන් බවට පරිවර්තනය වීම ගැන මවිත වේ - ජර්මනිය පවා මේ ''විනාශයේ''[109] කුඩා ප්‍රාථමික අත්දැකීමක් ලබා ඇත; තමන්ගේම ශ්‍රමය මත පදනම් වූ පෞද්ගලික අයිතිය කම්කරුවන්ගේ දේපල රහිත බව දක්වා අවශ්‍යයෙන්ම වර්ධනය වන අතර, සියලු ධනය ශ්‍රමිකයන් - නොවූවන්ගේ අතට වඩ වඩාත් සංකේන්ද්‍රණය වේ; එය{…}*

---

* අත්පිටපත මෙතැනින් අවසන් වෙයි. පසුව එන කොටස වෙනත් කඩදාසියක ලියනු ලැබ ඇති අතර, එය පළමුවන දළ සටහනෙහි අවසාන පිටුව බව අදහස් කරන සටහනක් වෙනත් අයෙකුගේ අත් අකුරින් ලියා ඇත. - **සංස්කාරක**

* මෙතැනදී අත්පිටපත නවතී. - සංස්කාරක

109 - එංගල්ස් මෙහිදී සඳහන් කරනුයේ 1873 ආර්ථික අර්බුදය ගැනය. ජර්මනියේ 1873 මැයි මස ''භයානක පරිහානියකින්'' අර්බුදය ආරම්භ වූ අතර, එය හැත්තෑගණන්වල අවසානය දක්වා ඇදුනා වූ අර්බුදයක ලකුණු පහල කළේය.